ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# University of Sri Jayewardenepura

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## External Degrees and Extension Courses Unit

# විශේෂ නිවේදනයයි!

## 19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය (අදියර I) – 2026 මාර්තු 28

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ පළමු අදියර **2026 මාර්තු මස 28** වන සෙනසුරාදා දින කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

එහිදී පිරිනැමීමට නියමිත බාහිර උපාධි පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

1. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය
2. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය
3. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
4. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය
5. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය

- අවසාන විභාග ප්‍රතිඵල අනුව මෙවර උපාධි ප්‍රදානෝත්සවයට සුදුසුකම් ලබා ඇති උපාධිලාභීන්ගේ නාම ලේඛනය https://external.sjp.ac.lk/2026-convocation-notice/ යන වෙබ් අඩවියෙහි පළ කර ඇත. ඒ අනුව මෙතෙක් අයදුම් නොකළ උපාධිලාභීන් වෙතොත් 2026-03-13 වන දින හෝ එදිනට පෙර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට පැමිණ අයදුම්පත්‍ර භාර දෙන ලෙස දන්වමි.
- උපාධි ලෝගු සහ ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම මෙන්ම ඡායාරූප ගැනීමට අදාළ ලියාපදිංචි කටයුතු 2026 මාර්තු මස 21 සහ 22 දිනවල සිදු කරන අතර ඒ සඳහා ඔබ පැමිණිය යුතු දිනය, වේලාව ඇතුළු විස්තර http://external.sjp.ac.lk යන වෙබ් අඩවිය ඔස්සේ 2026-03-16 දිනෙන් පසුව දැනුවත් කරනු ඇත.

නියෝජ්‍ය ලේඛකාධිකාරී

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

2026-03-10

**දුරකථන අංක**

**0113485404**